සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2019 ජනවාරි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2019-01-26
සෙනසුරාදා
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.4 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 2018 මාර්තු මාසයට අදාළ පහත සඳහන් අගයන් **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමේ** පොත්වලින් උපුටාගන්නා ලදි:

| | **රු.** |
|---|---|
| අඩුකිරීම්වලට පෙර දළ වැටුප | 9,600,000 |
| උපයන විට ගෙවන බදු (PAYE) අඩු කිරීම | 325,000 |

සමාගම, දළ වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා [Employees' Provident Fund (EPF)] 12% ක් සහ සේවක භාරකාර අරමුදල සඳහා [Employees' Trust Fund (ETF)] 3% ක් බැගින් දායක වේ. සේවක අර්ථසාධක අරමුදල සඳහා (EPF) සේවකයන්ගේ දායකත්වය 8% කි.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු මාසය සඳහා වන ශුද්ධ වැටුප වන්නේ:

(1) රු.7,355,000/-. (2) රු.8,507,000/-. (3) රු.9,275,000/-. (4) රු.7,067,000/-.

(ලකුණු 02)

**1.2** ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගය වැඩියෙන් සටහන් වී තිබෙන විටක, ලාභයට වන බලපෑම දක්වනු ලබන්නේ පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, කුමන ප්‍රකාශනයෙන් ද?

(1) ප්‍රවර්තන වර්ෂයේ ලාභය අඩුවෙන් සටහන් වන අතර, ඊළඟ වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වේ.

(2) ප්‍රවර්තන වර්ෂයේ ලාභය සහ ඊළඟ වර්ෂයේ ලාභය වෙනස් නොවේ.

(3) ප්‍රවර්තන වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වන අතර, ඊළඟ වර්ෂයේ ලාභය අඩුවෙන් සටහන් වේ.

(4) ප්‍රවර්තන වර්ෂයේ ලාභය වෙනස් නොවන අතර, ඊළඟ වර්ෂයේ ලාභය වැඩියෙන් සටහන් වේ. (ලකුණු 02)

**1.3** පහත සඳහන් ප්‍රකාශන, වගකීම සීමාසහිත සමාගමක දිගුකාලීන ණයසාධන පත්‍රවලට (debt instruments) අදාල වේ:

**(a)** ණයකර සහ සාමාන්‍ය කොටස්, ප්‍රධාන ණයසාධන පත්‍ර දෙක වේ.

**(b)** බොහෝ අවස්ථාවලදී, ණයසාධන පත්‍රවල ස්ථාවර පොලී අනුපාතිකයක් තිබේ.

**(c)** සාමාන්‍යයෙන් ණයසාධන පත්‍රවලට ඡන්ද අයිතියක් හිමි නොවේ.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.4** **සීමාසහිත එවර් රිච් (පෞද්ගලික) සමාගමට** දේපළ කිහිපයකින් කුලී ආදායම් ලැබේ. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම ලද මුළු කුලිය රු.481,200/- කි.

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත:

| විස්තරය | 2017 අප්‍රේල් 01 දිනට (රු.) | 2018 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| කලින් ලද කුලී | 28,700 | 31,200 |
| හිඟ කුලී | 21,200 | 18,400 |

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු කුලී ආදායම වන්නේ:

(1) රු.475,900/-. (2) රු.460,900/-. (3) රු.486,500/-. (4) රු.501,500/-.
(ලකුණු 02)

*අංක 1.5 සිට 1.8 දක්වා ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන්න.*

**1.5** වගකීමක්, ජංගම වගකීමක් ලෙස වර්ග කිරීමට සම්පූර්ණ කළයුතු නිර්ණායක දෙකක්(02) සඳහන් කරන්න.
(ලකුණු 02)

**1.6** 2018 මාර්තු 31 දිනට තොග ගණනය කර අගය කරන ලද එක්තරා කේවලස්වාමි ව්‍යාපාරිකයෙකු තොගයෙන් රු.2,000,000/- ක් පිරිවැය වූ කොටසක් යල්පැන ඇති බව හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, එම තොගය රු.1,800,000/- ක මුදලකට විකිණිය හැකි අතර, ඒ වෙනුවෙන් විකුණුම් මිලෙන් 15% ක් වූ අමතර විකුණුම් කොමිස් මුදලක් තෙවැනි පාර්ශවයකට ගෙවිය යුතු වේ.

2018 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල දැක්විය යුතු ඉහත තොගයේ වටිනාකම හඳුනා දක්වන්න. (ලකුණු 03)

**1.7** පවතින හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස් වීම / ප්‍රතිසංවිධානය වීම (reconstitution) අවශ්‍ය කෙරෙන අවස්ථා තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත අනුව පහත සඳහන් එක් එක් දෑ සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන සඳහන් කරන්න:

(a) ව්‍යාපාරයේ ස්වභාවය වෙනස්වීම.

(b) හවුල් ව්‍යාපාරයට නව හවුල්කරුවෙකු හඳුන්වා දීම. (ලකුණු 04)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

2018 අගෝස්තු 01 දිනට **නදුන් ට්‍රේඩර්ස්** හි වෙළෙඳ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු.585,600/- ක් විය.

2018 අගෝස්තු මාසය තුළ වෙළෙඳ ණයගැතියන්ට අදාලව පහත සඳහන් සාරාංශගත ගනුදෙනු සමාගමේ වාර්තාවලින් උපුටාගන්නා ලදි:

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 258,000 |
| ආපසු එවුම් | 23,800 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 189,000 |
| දුන් වට්ටම් | 4,900 |

වෙළෙඳ ණයගැති ලෙජරයෙහි ඇතුලත් තනි තනි (individual) ණයගැති ගිණුම් ශේෂවල එකතුව, වෙළෙඳ ණයගැති පාලන ගිණුමේ ශේෂයට වෙනස් බව පසුව කරන ලද පරීක්ෂාවේදී හෙළිදරව් විය. එම වෙනස සඳහා හේතු පහත පරිදි වේ:

(1) අගෝස්තු මාසයට අදාල දෛනික විකුණුම් පොතෙහි එකතුව රු.20,000/- ක් වැඩියෙන් එකතු කර ඇත.

(2) වෙළෙඳ ණයගැතියෙක්ගෙන් ලද රු.28,000/- ක මුදලක්, පාලන ගිණුමේ නිවැරදිව වාර්තා කර තිබුණ ද, ණයගැතියන්ගේ තනි තනි ලෙජර් ගිණුම් තුළ වාර්තාකර නොතිබුණි.

(3) ගැනුම් ඉන්වොයිසි තුනක් වැරදීමකින් ණයට විකුණුම් ලෙස දෛනික විකුණුම් පොතෙහි ඇතුලත් කර තිබුණි. මෙම ඉන්වොයිසිවල මුළු එකතුව රු.27,000/- ක් වන අතර, මෙය ණයගැතියන්ගේ තනි තනි ලෙජර ගිණුම්වල සහ ණයගැති පාලන ගිණුමේ වාර්තාකර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත අයිතම තුන ගැලපීමෙන් පසු, 2018 අගෝස්තු 31 දිනට පැවති නිවැරදි ශේෂය පෙන්නුම් කිරීම සඳහා, වෙළෙඳ ණයගැති පාලන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

**කසුන්, දසුන්** සහ **සුපුන්** ලාභ/ලාභ පිළිවෙලින් 4 : 3 : 3 අනුපාතයට බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක නිරත වේ. හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ:

- ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වර්ෂයකට 10% ක පොලියක් ගෙවනු ලබයි.
- **දසුන්** වර්ෂයකට රු.300,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගෙන ඇත.

| | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **කසුන්** | | 4,000,000 |
| **දසුන්** | | 3,000,000 |
| **සුපුන්** | | 3,000,000 |
| ගැනිලි: | | |
| **කසුන්** | 1,200,000 | |
| **දසුන්** | 600,000 | |
| **සුපුන්** | 300,000 | |

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනයට පෙර ශුද්ධ ලාභය රු.2,031,250/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම **පිළියෙල කරන්න**.(ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත විද්‍යා (පෞද්ගලික) සමාගම,** එහි සේවකයන්ට ශුද්ධ වැටුප් වශයෙන් රු.27,000,000/- ක් ගෙවන ලදි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද අදාල වේ:

(1) සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] සහ සේවක භාරකාර අරමුදලට [Employees' Trust Fund (ETF)] අදාල දායකත්වයන් දළ වැටුප මත පදනම්ව ගණනය කරනු ලබයි.

(2) සේවක අර්ථසාධක අරමුදල සඳහා (EPF) සේවකයින්ගේ දායකත්වය සහ සමාගමේ දායකත්වය පිළිවෙලින් 8% ක් සහ 12% ක් වේ.

(3) සේවක භාරකාර අරමුදලට (ETF) දායකත්වය 3% කි.

(4) සෑම සේවකයෙකුගේම දළ වැටුපෙන් 2% ක ප්‍රමාණයක්, සේවක සුභසාධක අරමුදල් දායකත්වය වශයෙන් අඩු කිරීම අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත විද්‍යා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් සාරාංශගත වැටුප් පත්‍රය තුළ ඉහත සඳහන් තොරතුරු **සටහන් කරන්න**.

| දළ වැටුප (රු.) | සුභසාධන අරමුදල් දායකත්වය (රු.) | සේවක අර්ථසාධක අරමුදලට (EPF) අඩුකිරීම් (රු.) | ශුද්ධ වැටුප (රු.) | සමාගමේ දායකත්වය (රු.) | |
|---|---|---|---|---|---|
| | | | | සේවක අර්ථසාධක අරමුදල (EPF) | සේවක භාරකාර අරමුදල (ETF) |
| | | | | | |

(ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**හසිත ට්‍රේඩර්ස්හි** 2018 මැයි 31 දිනට මුදල් පාලන ගිණුමෙහි (මුදල් පොතෙහි) හර ශේෂය (වාසිදායක ශේෂය) රු.328,500/- ක් වූ අතර, 2018 මැයි මාසයට අදාල මුදල් ලැබීම් ජර්නලයෙහි සහ මුදල් ගෙවීම් ජර්නලයෙහි සාරාංශයක් පහත දැක්වේ:

**මුදල් ලැබීම් ජර්නලය**

| දිනය | ලැබීම් | වටිනාකම(රු.) |
|---|---|---|
| 2018.05.02 | මුදල් තැන්පතු | 28,000 |
| 2018.05.05 | අහමඩ් - චෙක්පත් අංක 343212 | 60,000 |
| 2018.05.12 | සීමාසහිත බර්නාඩ් (පෞද්ගලික) සමාගම - චෙක්පත් අංක 451678 | 45,000 |
| 2018.05.18 | අමාලි ප්‍රින්ටර්ස් - චෙක්පත් අංක 231457 | 30,000 |
| 2018.05.30 | W. නිහාල් - චෙක්පත් අංක 117654 | 35,000 |
| | | **198,000** |

**මුදල් ගෙවීම් ජර්නලය**

| දිනය | ගෙවීම් | වටිනාකම(රු.) |
|---|---|---|
| 2018.05.02 | මනෝහර - චෙක්පත් අංක 157842 | 50,000 |
| 2018.05.05 | හරේන්ද්‍ර - චෙක්පත් අංක157843 | 26,000 |
| 2018.05.08 | P.ඩොනල්ඩ් - චෙක්පත් අංක 157844 | 34,000 |
| 2018.05.26 | M. හර්ෂ - චෙක්පත් අංක 157845 | 11,000 |
| 2018.05.29 | සීමාසහිත මනහර (පෞද්ගලික) සමාගම - චෙක්පත් අංක 157846 | 13,500 |
| | | **134,500** |

2018 මැයි මාසයට අදාල **හසිත ට්‍රේඩර්ස්** හි බැංකු ප්‍රකාශනයෙහි උද්ධෘතයන් පහත දැක්වේ:

| දිනය | විස්තරය | හර (රු.) | බැර(රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2018.05.01 | ශේෂය | | | 265,000 |
| 2018.05.03 | මුදල් තැන්පතු | | 28,000 | 293,000 |
| 2018.05.05 | චෙක්පත් ගෙවීම් - 157842 | 50,000 | | 243,000 |
| 2018.05.08 | චෙක්පත් තැන්පතු - 343212 | | 60,000 | 303,000 |
| 2018.05.12 | චෙක්පත් ගෙවීම් - 157843 | 26,000 | | 277,000 |
| 2018.05.15 | චෙක්පත් තැන්පතු - 451678 | | 45,000 | 322,000 |
| 2018.05.18 | චෙක්පත් ගෙවීම් - 157844 | 34,000 | | 288,000 |
| 2018.05.23 | චෙක්පත් තැන්පතු - 231457 | | 30,000 | 318,000 |
| 2018.05.25 | ණය වාරිකය | 30,000 | | 288,000 |
| 2018.05.27 | සෘජු තැන්පතු - 141567 | | 12,000 | 300,000 |
| 2018.05.31 | බැංකු ගාස්තු | 2,500 | | 297,500 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මැයි 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2018 මැයි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

2015 අප්‍රේල් 01 දින ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද **සරණ සුභසාධක සමාජයට** අදාලව පහත සඳහන් තොරතුරු ඔබට ලබාදී ඇත.:

(1) සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික දායක මුදල රු.3,000/- කි.

(2) 2017 අප්‍රේල් 01 දිනට සාමාජිකයන් 5 දෙනෙකුගේ වාර්ෂික සාමාජික දායක මුදල් හිඟව පැවති අතර, සාමාජිකයන් 3 දෙනෙකුගෙන් වාර්ෂික සාමාජික දායක මුදල් කලින් ලැබී තිබුණි.

(3) 2018 මාර්තු 31 දිනට සාමාජිකයන් 8 දෙනෙකු ප්‍රවර්තන වර්ෂයට අදාල සාමාජික දායක මුදල් ගෙවා නොතිබූ අතර, මින් සාමාජිකයන් 3 දෙනෙකු පසුගිය වර්ෂයට අදාලව ද සාමාජික දායක මුදල් ගෙවා නොතිබුණි. සාමාජිකයන් 5 දෙනෙකු ඊළඟ වර්ෂයට අදාල සාමාජික දායක මුදල් කලින් ගෙවා තිබුණි.

(4) 2018 මාර්තු 31 දිනට සමාජයේ සාමාජිකයන් 153 දෙනෙකු සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජිකයන්ගේ සාමාජික දායක මුදල් ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

**ඕල්ඩ් බෝයිස් ක්‍රිකට් සමාජය,** එහි සාමාජිකයන්ට ක්‍රීඩා පහසුකම් සපයනු ලබන ක්‍රීඩා සමාජයක් වන අතර, සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් සඳහා ආපනශාලාවක් ද පවත්වාගෙන යයි. තවද එම පරිශ්‍රය එළිමහන් ක්‍රීඩා උත්සව සඳහා කුලී පදනම මත ලබාදීමද සිදුකරනු ලබයි.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි වේ:

*(රු.'000)*

| ලැබීම් සහ ගෙවීම් ගිණුම | | | |
|---|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට ඉ/ගෙ ශේෂය | 18,500 | වැටුප් | 2,900 |
| පරිත්‍යාග | 12,300 | ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම් | 3,600 |
| කුලී ආදායම | 21,500 | අවන්හලේ සැපයුම්කරුවන්ට ගෙවීම් | 24,200 |
| සාමාජික දායක මුදල් | 8,400 | විදුලිය සහ ජලය - අවන්හල | 1,600 |
| ආපනශාලා විකුණුම් | 30,500 | අවන්හලේ වෙනත් වියදම් | 2,500 |
| යාවජීව සාමාජිකත්වය මත දායක මුදල් | 200 | ප්‍රචාරණය | 2,500 |
| | | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම් (2018 දෙසැම්බර් 31 දින) | 18,000 |
| | | වෙනත් වියදම් | 4,100 |
| | | 2018 දෙසැම්බර් 31 දිනට ප/ගෙ ශේෂය | 32,000 |
| | **91,400** | | **91,400** |

වත්කම් සහ වගකීම් පහත පරිදි විය:

*(රු.'000)*

| | **2018 ජනවාරි 01 දිනට** | **2018 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| යාවජීව සාමාජික දායක අරමුදල | 2,200 | ? |
| අවන්හලේ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 3,200 | 3,800 |
| හිඟ සාමාජික දායක මුදල් | 800 | 500 |
| ක්‍රීඩා භාණ්ඩ - ධාරණ අගයට | 45,000 | 54,000 |
| ඉඩම සහ ගොඩනැගිල්ල - ධාරණ අගයට | 30,000 | 29,000 |
| අවන්හලේ තොගය (පිරිවැයට) | 4,500 | 3,200 |
| කලින් ගෙවූ විදුලිය සහ ජලය - අවන්හල | 200 | 100 |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

- පරිත්‍යාග, වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය.
- 2018 දෙසැම්බර් 31 දින මිලටගත් ක්‍රීඩා උපකරණ හැර, වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නොතිබුණි.
- වර්ෂය අවසානයේ පැවති යාවජීව සාමාජික දායක අරමුදලෙන් 10% ක් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ඕල්ඩ් බෝයිස් ක්‍රිකට් සමාජයේ** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවන්හල් වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**සුවිමාලි ෆැෂන්** හි සහකාර ගණකාධිකාරිවරයා විසින් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය පිළියෙල කර ඇති අතර, වර්ෂයට අදාල ශුද්ධ ලාභය ලෙස රු.1,783,000/- ක් ගණනය කර ඇත.

(1) 2018 මාර්තු 31 දිනට ලෙජර් ගිණුම්වල ඇති ශේෂ පහත පරිදි වේ:

| | **2018 මාර්තු 31 දිනට (රු.)** |
|---|---|
| මෝටර් වාහන - පිරිවැයට | 4,900,000 |
| කාර්යාල උපකරණ - පිරිවැයට | 550,000 |
| සමුච්චිත ක්ෂය: | |
| මෝටර් වාහන | 2,450,000 |
| කාර්යාල උපකරණ | 137,500 |
| තොග - පිරිවැයට | 165,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 420,000 |
| ඉදිරියට කළ ගෙවීම් | 11,500 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 125,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 720,000 |
| උපචිත වියදම් | 65,000 |
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 1,190,000 |
| අයිතිකරුගේ ගැනිලි | 174,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(2) ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, 2018 මාර්තු 31 දිනට පිරිවැය මත අගය කරන ලද අවසාන තොගය ගිණුම් පොත්වලට ගෙන ඇත. කෙසේවුවද, එම තොගවල ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.150,000/- කි.

(3) 2016 අප්‍රේල් 01 දින රු.2,000,000/- කට අත්පත් කර ගත් මෝටර් රථයක්, 2018 මාර්තු 31 දින රු.1,300,000/- කට, 2018 අප්‍රේල් 10 ලෙස දිනය යෙදූ චෙක්පතක් බාරගනිමින් විකුණා ඇත. මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නැත. මෝටර් වාහන පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට, වර්ෂයකට 25% බැගින් ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනට, **සුවිමාලි ෆැෂන්** හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**රශ්මි, පුෂ්මි** සහ **කුෂ්මි** විසින් **මිමි කලෙක්ෂන්ස්** නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුළත් වේ.

- හවුල්කරුවන් ඔවුන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත, වාර්ෂිකව 6% බැගින් වූ ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හිමිකම් ලබයි.
- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සහභාගිවීම වෙනුවෙන් **පුෂ්මි** සහ **කුෂ්මි,** එක් අයෙකුට රු.35,000/- බැගින් වූ මාසික වේතනයක් ලැබීමට හිමිකම් ලබයි.
- **රශ්මි, පුෂ්මි** සහ **කුෂ්මි** අතර ලාභා'ලාභ පිළිවෙලින් 3 : 1 : 1 යන අනුපාතයට බෙදාගනු ලැබේ.

(2) 2018 මාර්තු 31 දිනට **මිමි කලෙක්ෂන්ස්** හි ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **රශ්මි** | | 1,500 |
| **පුෂ්මි** | | 500 |
| **කුෂ්මි** | | 500 |
| 2017 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම්: | | |
| **රශ්මි** | 65 | |
| **පුෂ්මි** | | 5 |
| **කුෂ්මි** | 50 | |

(3) පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

- 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.1,490,000/- කි.
- 2018 මාර්තු 31 දින, හවුල්කරුවන් ව්‍යාපාරයේ කළමනාකාරීත්ව කටයුතු කෙරෙහි දක්වන දායකත්වය අනුව ලාභ බෙදාගන්නා අනුපාතය **රශ්මි, පුෂ්මි** සහ **කුෂ්මි** අතර පිළිවෙලින් 2 : 1 : 1 ලෙස වෙනස් කිරීමට ඔවුන් විසින් තීරණය කරන ලදී.
- එදිනම, ඔවුන් විසින් හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,000,000/- ක් ලෙස අගය කරනු ලැබූ අතර, කීර්තිනාම ගිණුමක් විවෘත නොකොට, කීර්තිනාමය, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**මිමි කලෙක්ෂන්ස්** හි, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ඉහත ගනුදෙනු වාර්තා කිරීමට පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත හාෂා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 500,000) | | 5,000 |
| 2017 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 7,325 |
| පොදු සංචිත | | 850 |
| කොටස් අයදුම්වලින් ලද මුදල් | | 2,400 |
| මෝටර් වාහන, පිරිවැයට | 32,500 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 2,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| මෝටර් වාහන | | 22,500 |
| කාර්යාල උපකරණ | | 1,600 |
| 2018 මාර්තු 31 දිනට තොගය | 6,615 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,220 | 1,350 |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 57 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 3,190 | |
| 12% ණයකර | | 5,000 |
| ලාභාංශ ගෙවීම් - අතුරු සහ අවසාන | 375 | |
| විකුණුම් | | 47,125 |
| විකුණුම් පිරිවැය | 23,500 | |
| පරිපාලන වියදම් | 3,050 | |
| බෙදාහැරීමේ වියදම් | 2,047 | |
| ණයකර පොලී ගෙවීම් | 300 | |
| වෙනත් මූල්‍ය වියදම් | 210 | |
| මාස 6 ස්ථාවර තැන්පතු (2018 මාර්තු 31 දින ආයෝජනය කරන ලද) | 11,000 | |
| වර්ෂය සඳහා ආදායම් බදු (සම්පූර්ණයෙන් පියවූ) | 200 | |
| **එකතුව** | **93,207** | **93,207** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) මූල්‍ය පහසුකම් වැඩිකිරීම සඳහා, එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩිකරන ලෙස බැංකුව විසින් සමාගමෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, 2018 ජනවාරි 31 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව කොටස් 200,000 ක්, කොටසක් රු.10/- බැගින් නිකුත් කරන ලදී. 2018 මාර්තු 01 දින වැඩිපුර ලැබුණු මුදල් ආපසු ගෙවීමටත් කොටස් විභජනය කිරීමටත් තීරණය කරන ලදී. කෙසේවෙතත්, කොටස් අයදුමේදී එකතු කරගත් මුදල් වාර්තාකිරීම හැර මෙයට අදාලව වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(2) 2017 අප්‍රේල් 01 දින, සමාගම, විසින් එකක් රු.100/- බැගින් වූ 12% ණයකර 50,000 ක් නිකුත්කරන ලදී. පොලිය, වර්ෂයකට දෙවතාවක් (bi-annually), සෑම වර්ෂයකම අප්‍රේල් 01 දින හා ඔක්තෝම්බර් 01 දින ගෙවිය යුතුවේ.

(3) පුළුල් කිරීමේ වැඩසටහනක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම, නිෂ්පාදන ක්‍රියාවලිය දෙසට යොමුකිරීමට තීරණය කරන ලද අතර, ඒ අනුව සමාගම 2018 පෙබරවාරි 15 දින ණය පදනම මත රු.50,000,000/- ක් පිරිවැය වූ නව යන්ත්‍රයක් මිලදී ගත් අතර, 2018 මාර්තු 01 දින නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. යන්ත්‍රයේ පිරිවැය සහ ස්ථාපිත කිරීමේ පිරිවැය වන රු.2,800,000/- ක මුදල 2018 අප්‍රේල් 15 දින පියවිය යුතු විය. කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

(4) පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |
| යන්ත්‍ර | : | වර්ෂ 10 |

(5) 2018 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත වියදම් සහ ඉදිරියට කළ ගෙවීම් ගිණුම් පොත්වල වාර්තා කළ යුතුව ඇත:

| | | |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | : | රු.45,000/- |
| ඉදිරියට ගෙවූ රක්ෂණ | : | රු.8,000/- |

(6) 2018 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව රු.123,000/- ක් දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2018 ජූනි 15 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත භාෂා (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 11)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 14)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ද හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |